
# මගේ පිස්සු පූසා



යෂිනා භාග්‍යා පීරිස්

# මගේ පිස්සු පූසා


**යෂිනා භාග්‍යා පීරිස්**

**කතෘ**



**පළමු දිගහැරීම**



**මහ/ මහාමායා බාලිකා විද්‍යාලය**

**5-D**



**2025-02-08**

ISBN **අංකය : 978-624-208-618-7**

# පටුන

1 පූසෙක් නැති මම දුකින් සිටිය හැටි

2 අප්පච්චි පූසෙක් ගෙනවිත් දුන් දා

3 පූසාව ආදරයෙන් බලාගත්ත හැටි

4 ස්වීටිගේ පිස්සු වැඩ

# පිදුම

මාගේ කුළුඳුල් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දුන්

ගරු විදුහල්පතිතුමියට .....

මා වෙනුවෙන් වෙහෙස මහන්සි වී කතාවේ

අඩුපාඩු සකස් කර දුන් මාගේ ගුරු මෑණියන්ට ද .....

මා මෙලොවට බිහි කළ මෑණියන්ට ද .....

වෙහෙස මහන්සි වී මා පෝෂණය කළ

පියාණන්ට ද.....

මාගේ ආදරණීය මිතුරියන්ට පුද දෙමි මේ අතැඹුල

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# 1. පූසෙක් නැති මම දුකින් සිටිය හැටි

වයස අවුරුදු දහයක් වන මට පූසෙක් ඇති කිරීමට ආසාවක් ඇති වුණා. මම ගොඩක් කැමති ලා දුඹුරුයි, සුදුයි පූසන්ට. එයාලා හරිම හුරුබුහුටියි. මට පූසෙක් හිටියානම් මම එයත් එක්ක සෙල්ලම් කරනවා. ඒත් අම්මා පූසන්ට කැමති නෑනේ. තාත්තා කැමතිත් නෑ. ඒත් අයියායි, මමයි පූසන්ට ගොඩක් කැමතියි. පූසෙක් ගෙනෙවිත් දුන්නාම මම එයාගේ බෙල්ලට ලස්සන ගෙජ්ජියක් දානවා.ලොකු අම්මාටත් කරදර කරා මට පූසෙක් ගෙනල්ලා දෙන්න කියලා. වෙලාවකට අම්මා මට බනිනවා හැමවෙලාවෙම පූසෝ ගැන කියවනවා කියලා.

දවසක් මම අම්මත් එක්ක තරහ වුණා. ටික දවසක් ගතවුණා. මම අප්පච්චිට කිවුවා.

''අනේ අප්පච්චි මගේ හොඳ අප්පච්චිනේ අනේ බෑ කියන්නේ නැතුව මට පූසෙක් ගෙනත් දෙන්නකෝ ''

මම ඒ වෙලාවේ අප්පච්චිට පොරොන්දුවක් වුණා මට පූසෙක් ගෙනල්ලා දුන්නොත් මම ශිෂ්‍යත්ව විභාගය පාස් වෙනවා කියලා. එහෙම කියනකොට අප්පච්චි මගේ ඔළුව අතගෑවා. අප්පච්චි කිව්වා. ''හරි මගේ දුවට ළඟදීම පූසෙක් ගෙනල්ලා දෙන්නම්කෝ'' කියලා. ඒත් මට තව කොච්චර දවස් ඉන්න වෙයිද කියලා හිතෙනවා. කමක් නෑ ''ඉවසීමෙන් සැනසීම ලැබේ'' කියලා කියනවානේ.



මට පූසෙක් ඕන නිසා දවසක් මම අම්මාට මෙහෙම කිව්වා. ''අම්මේ මට පූසෙක් ගෙනල්ලා දුන්නොත් ගෙදර ඉන්න හූනෝ, කැරපොත්තෝ, මීයෝ තව පුංචි පුංචි සත්තු අඩු වෙනවානේ.'' ''ඉතින් අම්මේ අපි පූසෙක් ගේමු නේද ?'' හරි පුතේ අප්පච්චි කිව්වානේ ළඟදීම පූසෙක් ගෙනත් දෙනවා කියලා.

## 2. අප්පච්චි පූසෙක් ගෙනවිත් දුන් දා

සති දෙකක් විතර ගියා. අද අප්පච්චි ගෙදර එනවා. මම අම්මාගෙන් ඇහුවා. ''අප්පච්චි අදවත් මට පූස් පැටියෙක් ගෙනත් දෙයිද?'' කියලා. අම්මා කිව්වා ''බලමු මගේ දුවේ.'' කියලා. මම පාඩම් කරමින් සිටියා. ''දුව කෝ'' අප්පච්චි අම්මාගෙන් අහනවා මට ඇහුණා. මම එකපාරටම සාලෙට දුවගෙන ගියා. අයියාත් දුවගෙන ආවා. අප්පච්චි මගේ අතට පෙට්ටියක් දුන්නා. මම අයියාත් එක්ක ඉක්මනින් පෙට්ටිය ලිහුවා. එක පාරටම ඤාව්.... ඤාව්.... කියමින් පෙට්ටියෙන් එළියට පූස් පැටියෙක් පැන්නා. ඌ බයවෙලා අල්මාරිය යට ගුලි වී සිටියා.




මමයි අයියායි පූස් පැටියාව ගන්න බැලුවත් ඌ ආවේ නැහැ. මම මාළු කෑල්ලක් ඌ ළඟට ළං කළා. මාළු කෑල්ලේ සුවඳට ඌ මගේ ළඟට ආවා. මම ඌව ආදරයෙන් වඩා ගෙන මාළු කෑල්ල දුන්නා. මට අද ගොඩක් සතුටුයි. මම අයියාට පූස් පැටියාව දීලා අප්පච්චිව බදාගෙන  මෙහෙම කිව්වා.

''මගේ හොඳ අප්පච්චි මම ඔයාට ගොඩක් ආදරෙයි. මම අප්පච්චිට දුන්න පොරොන්දුවත් ඉටු කරන්නම්. අම්මා පූසාටත් අපිටත් රසවත් කෑම සාදා දුන්නා. අද මට හරිම සතුටු දවසක්.

## 3. පූසාව ආදරයෙන් බලාගත්ත හැටි

මම වෙනදාට වඩා උදේම නැගිට්ටා. පූසා ඇඳාවී ගාමින් මගේ කකුල්වල ඇතිල්ලුනා. මම ඌව ආදරයෙන් වඩා ගත්තා. අම්මාට කියලා කිරි සාදා ගත්තා. පූස් පැටියාට කිරි පෙව්වා. අයියාත් නැගිටලා කුස්සියට ආවා. අපි දෙන්නාම පූස් පැටියාට නමක් කල්පනා කලා. ඌට ස්වීට් කියලා නම දැම්මා. අයියායි මමයි නිතරම පූසාට ස්වීට් කියලා කතා කළා. මම ස්වීට්ට රෙදි බෝනික්කෙක් දුන්නා. ඌ ඒක හපමින් බෝනික්කාත් එක්ක සෙල්ලම් කළා. ඌගේ සෙල්ලම් දැකලා අයියාටයි මටයි හරිම සතුටුයි.



දින කිහිපයක් ගත වුණා. පූසාට ස්වීටි කියන නම හුරු වුණා. තාත්තා ස්වීටිගේ බෙල්ලට දාන්න ලස්සන ගෙජ්ජියක් ගෙනත් දුන්නා. මම ගෙජ්ජිය ස්වීටිගේ බෙල්ලට දැම්මා.

ස්වීටි දැන් හරිම ලස්සනයි. ස්වීටි කොහේ ගියත් ගෙජ්ජියේ සද්දෙට මට එයාව සොයාගන්න පුළුවන්. අම්මා ස්වීටිට මාළු තම්බා දුන්නා. ස්වීටි හරිම ආසාවෙන් මාළු කෑවා. අම්මා සිනිඳු රෙදි කෑල්ලකින් ස්වීටිට රවුම් කොට්ටයක් මහලා දුන්නා. දැන් අම්මයි තාත්තායි ස්වීටිට හරිම ආදරෙයි.



මම අප්පච්චිට කිව්වා ස්වීට්ට පිඟානක්, කෝප්පයක් සහ පූස් කෑම ගෙනත් දෙන්න කියලා. අප්පච්චි පහුවදාම ඒවා ගෙනත් දුන්නා. මම අප්පච්චි ගෙනාපු පූස් කෑම එකෙන් ටිකක් ස්වීට්ගේ පිඟානට දැම්මා. අම්මෝ !!! පුදුම වේගයකින් ස්වීට් පූස් කෑම කෑවේ. මට හරිම සතුටුයි. අම්මා මහලා දුන්න කොට්ටය උඩට ගිහින් ස්වීට් පැය කිහිපයක් නිදා ගත්තා. මමත් හරි සතුටින් පාඩම් කළා.



ශිෂ්‍යත්වය හෙට. අප්පච්චිට වුණා පොරොන්දුවත් මට මතක් වුණා. මම පහුවදා විභාගය ලිව්වා. ටික දිනක් ගත වුණා. එහා ගෙදර පූසා අපේ ස්වීටි දිහා බලා සිටියා. මම පාසල් ඇරී ගෙදර එන විට ස්වීටි ගෙදර හිටියේ නෑ. මම අම්මාගෙන් ඇහුවා. අම්මා කිව්වා. ''මම මාළු තම්බලා කන්න දුන්නාට පස්සේ නිදා ගත්තා. ඊට පස්සේ මම දැක්කේ නෑ දුවේ'' කියලා.

ටික වෙලාවක් ගියා. මට ඇහුණා එහා ගෙදරින් පූසන් රණ්ඩු වෙන සද්දයක්. මම ඉක්මනට දුවගෙන ගියා. එතකොට මගේ ස්වීටියි එහා ගෙදර පූසයි හොඳටම රණ්ඩු වෙනවා. ඒ ගෙදර නැන්දයි අපේ අම්මයි එකතු වෙලා පූසන්ගේ රණ්ඩුව බේරුවා.


අනේ දෙවියනේ ! මගේ ස්වීටිට තුවාල වෙලා. මම ස්වීටිව වඩා ගෙන ගෙදර ගෙනත් අයියාත් එක්ක එයාට බෙහෙත් දැම්මා. ටික වෙලාවක් යද්දි ස්වීටිට හොඳටම නින්ද ගියා. ස්වීටි බයවෙලා දැන් කොහෙවත් යන්නේ නෑ. ටික දවසක් ගියා. ස්වීටිට සනීප වුණා.

## 4. ස්වීටිගේ පිස්සු වැඩ

අද මට පාසල් නිවාඩු දවසක්. මම උදේ නැගිටින විට ස්වීටි මගේ ළඟ තුරුලු වෙලා. අම්මා මාළු බඳින සුවඳට ස්වීටි නැගිට්ටා. මම මුහුණ සෝදා ගෙන ගෙට එන විට ස්වීටිට පිස්සු හැදිලා වගේ. පුටුවල දුවනවා, මගේ කකුල්වල එල්ලෙනවා,මේසේ තියෙන කොළ කෑලිවලට ඉරනවා. ඒ වගේම නූල් බෝලයක් අරගෙන එහෙ මෙහෙ පනිනවා. ඒවා දැකපු මට හරිම සන්තෝසයි. ස්වීටි හොඳටම සෙල්ලම් කරපු නිසා එයාට මාළු කන්න දුන්නා. ස්වීටි මාළු ඉක්මනට කෑවා. අයියායි මමයි බෝලයෙන් සෙල්ලම් කරන විට ස්වීටිත් බෝලේ පස්සෙන් දුවනවා. අපිට වගේම ස්වීටිටත් හරිම මහන්සියි.ස්වීටි නිදා ගත්තා. රෑ වෙලා කුස්සියේ බෝතල් පෙරළෙන සද්දයක් ඇහුණා. අම්මයි මමයි නැගිට්ටා. ස්වීටි මීයෙක් අල්ලන්න කුරුමානම් අල්ලනවා.

ඒත් ස්වීට්ට මීයාව අල්ලා ගන්න බැරි වුණා. මම නිදා ගත්තා. උදේ නැගිටලා මම කුස්සියට ආවා. අම්මා කිව්වා. " ස්වීට් ඊයේ රෑ මීයා අල්ලාගෙන උෟව හපලා." දවල් වුණා. ස්වීට් කන්නෙත් නෑ, වතුර බොන්නෙත් නෑ.  හැම වෙලාවෙම නිදි. දිනක් ගත වුණා. මම අම්මාගෙන් ඇහුවා. "අනේ අම්මේ ස්වීට් සත්ත්ව රෝහලකට අරගෙන යමුද?" අම්මයි මමයි ස්වීට්ව සත්ත්ව රෝහලකට අරගෙන ගියා. පශු වෛද්‍යවරයා කිව්වා "ස්වීට් අසනීප වුණේ මීයා හපපු නිසා."  ස්වීට්ට බෙහෙත් දුන්නා. මම ස්වීට්ව තුරුලු කරගෙන උෟව ගෙදර අරගෙන ආවා.

උදේ වුණා. ස්වීට්ට සනීප වෙලා. මට හරිම සතුටුයි.මම සතුටින් පාසල් ගියා. එදා ශිෂ්‍යත්ව ප්‍රතිඵල ආවා. මම පාස් වෙලා. අප්පච්චිට වුණ පොරොන්දුව මම ඉෂ්ට කළා. මට හරිම සතුටුයි.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**978-624-208-618-7**